# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1994 අංක 1 දරන
# ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1994 ජනවාරි මස 28 වන දින]

පාර්ලිමේන්තුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1994 ජනවාරි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : ශත 60 යි.

තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1994 අංක 1 දරන ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1994 ජනවාරි මස 28 වන දින]

**එල්. ඩී.—ඕ. 102/90**

**ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එහි සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කාරණා එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් සහ එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1994 අංක 1 දරන ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට හා ඉන් පසු (මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය" යන නාමය හා අභිධානය යටතේ, අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද ඊට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඊට ඇත්තේ ය. ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය සංස්ථාගත කිරීම.

3. සංස්ථාවේ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි වේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) බලශක්ති කළමනාකරණ වෘත්තීය පිළිබඳ දැනීම ලබා ගැනීමට, බෙදා හැරීමට හා හුවමාරු කිරීමට ආධාර කිරීම ;

(ආ) ශ්‍රී ලංකාවේ බලශක්ති කළමනාකරණ පිළිබඳ වෘත්තීන් සඳහා දිරිගැන්වීම හා ඒවා නංවාලීම ;

(ඇ) බලශක්ති කළමනාකරණය සඳහා ආණ්ඩුවේ හා පෞද්ගලික සහාය ඵලදායක ලෙස සාමාජිකයන් වෙත ව්‍යාප්ත කළ හැකි මාධ්‍යයක් වශයෙන් ක්‍රියා කිරීම ;

(ඈ) ඵලදායක බලශක්ති කළමනාකරණය පිළිබඳ ප්‍රමාණවත් හා යාවත්කාල තොරතුරු සාමාජිකයන්ට සැපයීම ;

(ඉ) බලශක්ති කළමනාකරණය පිළිබඳ උපදේශක සේවා සැලසීම සඳහා දිරිගැන්වීම ; සහ

(ඊ) ඉහත සඳහන් පරමාර්ථ හෝ ඉන් කිසිවක් හෝ සාක්ෂාත් කර ගැනීමට ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා හා දේවල් කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ අවසන් කිරීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ වෙනත් ආධාර භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද තම අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාවේ යෙදීමට අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයෙහි යෙදවීමේ, සේවා නියුක්ත කිරීමේ හා අස්කිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ හෝ ඉන් යමක් හෝ ඉටු කිරීම හෝ සාක්ෂාත් කිරීමට අවශ්‍ය හෝ හිතකර සියලු කටයුතු, කාරණා හා දේවල් කිරීමේ සහ ඉටු කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ රීති මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි හා ඒ රීතිවලට අනුව තෝරාපත් කරගනු ලබන නිලධරයන්ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් තත් කාලයෙහි බලපවත්වන සංස්ථාවේ රීතිවලට යටත්ව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරන සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනානුකූල නොවන රීති කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියේ සාමාජිකත්වයට ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද සහ සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හා ඔවුන් නෙරපීම ;

(ආ) නිලධරයන් තෝරා පත්කර ගැනීම, නිලධරයන්ගේ ධුරවල ඇති වන පුරප්පාඩු සහ නිලධරයන්ගේ බලතල, චර්යාවන් සහ කාර්ය ;

(ඇ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීම සහ ඔවුන්ගේ බලතල, චර්යාව සහ කාර්ය ;

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ අනුසේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් පැවැත්විය යුතු වේලාවන්, ස්ථාන, රැස්වීම් පිළිබඳ දැන්වීම් සහ රැස්වීම්වල න්‍යාය පත්‍ර, රැස්වීම්වල ගණපූරණය සහ රැස්වීම්වල දී සැලකිල්ලට භාජනය කළ යුතු කරුණු;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ එකී ගිණුම් පවත්වාගෙන යාම හා ඒවා විගණනය කිරීම; සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එකී පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක්, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබිය හැකි ආකාරයෙන් ම සහ එවැනි ම රැස්වීමක දී වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියලු සාමාජිකයෝ සංස්ථාවේ රීතිවලට යටත් විය යුත්තා හ.

7. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ නියාදනය කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමටත්, දැරීමටත්, නීත්‍යනුකූලව සංස්ථාවට බලය ඇත්තේ ය. තවද ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හෝ අන්‍යාකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්වන රීති වලට යටත්ව එකී සියලු දේපළ දැරිය යුතු ය. සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. (අ) සංස්ථාවේ යම් සාමාජික පන්තියකට තෑනැත්තන් තෝරා ගැනීම සඳහා ගාස්තු; හා ගාස්තු හා දායක මුදල් අය කිරීමේ බලය.

(ආ) සාධාරණ යයි සංස්ථාව සලකන දායක මුදල් හා ගාස්තු සංස්ථාවේ සාමාජිකයන්ගෙන්

අය කිරීමට නීත්‍යනුකූල බලය සංස්ථාවට ඇත්තේ ය.

9. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංගමයේ පැවති සියළු ණය හා බැරකම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර එදිනට සංගමයට අය විය යුතු සියළු ණය හා සංගමයට ගෙවිය යුතු සියලු දායක මුදල්, සම්මාදම් හා ගාස්තු මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය. සංගමය විසින් ගෙවිය යුතු ණය සහ සංගමයට අය විය යුතු ණය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

10. සංස්ථාවේ සභාපති හෝ ඔහු නොමැති විට උපසභාපතිවරයෙකු හෝ ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතබනු ලැබිය යුතු අතර ඔවුන් විසින් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී තැන තම අත්සන් කළ යුතු ය. තව ද ඒ අත්සන් කිරීම යම් තැනැත්තකු විසින් සාක්ෂිකරුවකු වශයෙන් කරන ලද අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

11. මේ පනතේ සඳහන් තැනැත්තන් හා ඔවුන් වෙතින්, ඔවුන් මගින් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

12. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 255, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන වසර් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.